# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1780/13 - 2012 ඔක්තෝබර් මස 16 වැනි අඟහරුවාදා - 2012.10.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම්

ව්‍යවස්ථාපිත නිශ්චය අංකය :-4614

විශේෂ අංකය :- මාලේ/55

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය**

බ්‍රෙන්ඩා සීලවතී හලංගොඩ දෙල්විට මහත්මිය සතුව තිබූ ඉඩම් සම්බන්ධයෙන් ඇය මියගොස් සිටි බැවින් ඇයගේ ස්වාමි පුරුෂයා වන මාතලේ හලංගොඩ වලව්ව දරන ස්ථානයේ පදිංචි හැරී හලංගොඩ මහතා විසින් පනතේ 18 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් කරන ලදින්, බ්‍රෙන්ඩා සීලවතී දෙල්විට හලංගොඩ බූදලයට පනතේ 19 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරුට අයිතිව තිබූ කොටස නිශ්චය කරමින් ව්‍යවස්ථාපිත නිශ්චයක් කරන ලදී. එසේ ව්‍යවස්ථාපිත බදු ගැණුම්කරුට තබා ගැනීමට ඉඩදෙන ලද කෘෂිකාර්මික ඉඩම් කොටස් මෙහි උපලේඛනයෙහි දැක්වේ.

අධිනීතිඥ නිමල් ජී. පුංචිහේවා,<br>
සභාපති,<br>
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2012 ඔක්තෝබර් මස 16 වැනි දින,<br>
කොළඹ 07,<br>
හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ අංක සී 82 හි,<br>
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගොරකඇල 566, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගොරකඇල ගමෙහි පිහිටි සර්වෙයර් ජනරාල් විසින් අඳින ලද මූලික පිඹුරු 848 අතිරේක අංක 4, 5 හි දැක්වෙන දෙහිගස් හින්නේ වත්ත, නැමති ඉඩමේ අක්. 50 රූඩ් 0 පර්. 00 (හෙක්ටයාර් 20.2343) ප්‍රමාණය ඇති කැබලි අංක 223, 225, 227 දරන බිම් කැබලි සහ එහි තුළ පිහිටි ගහකොළ පලතුරු හා ගොඩනැගිලි ද වේ.

11-102